ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
---------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 23 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 අගෝස්තු 25 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3.1, 1.3.5 ඡේදයන්හි දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉදිරි වර්ෂ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 6 ක් යටතේ දරන ලද රු.636,976 ක් වූ වියදම් පෙර ගෙවුම් යටතේ ගිණුම්ගත කර නොකර වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) 2015 වර්ෂයේදී 2014 වර්ෂය සඳහා අවස්ථා 7 ක් යටතේ දරන ලද රු.194,615 ක් වූ වියදම් සමාලෝචිත වර්ෂයේ වියදමට ගෙන ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ඉදිරි වර්ෂ සඳහා ලැබුණු රු.192,034 ක් වූ ආදායම් කලින් ලැබීම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) කර්මාන්ත බැංකු ගිණුමට අදාල 2014 දෙසැම්බර් 31 දිනට වූ බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව අවස්ථා 3 කදී රු.687,742 ක් වූ කර්මාන්ත ගිණුමේ තැන්පතු පොදු බැංකු ගිණුමට තැන්පත් කිරීම සම්බන්ධයෙන් ගැලපීම් සිදුකර තිබුණද පොදු බැංකු ගිණුමට අදාල බැංකු සැසඳුම් ප්‍රකාශයේ එවැනි ගැලපීමක් දක්වා නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසාන ණයහිමි ශේෂයට රු.7,421,248 ක් වටිනා ණයහිමි ශේෂ 27 ක් ඇතුලත් කර නොතිබුණි.

(ඊ) පරිත්‍යාග ලෙස ලැබුණු රු.177,973 ක ප්‍රාග්ධන භාණ්ඩ ලැබීම අය ශීර්ෂ බැර නොකර ක්ෂේත්‍ර ගබඩා ගිණුම බැර කර තිබූ හෙයින් ක්ෂේත්‍ර ගබඩා ගිණුමේ ශේෂය හා ආදායම රු.355,946 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුල ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩ සටහන සඳහා ලැබුණු රු.1,000,000 ක මුදල ප්‍රාග්ධන ආදායම් යටතේ ගිණුම්ගත කෙරුණු වෙනුවට තැන්පතු යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවිය යුතු රු.4,658,734 ක මුදල ණයහිමියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය තුල දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවූ රු.1,718,311 ක ණය වාරික වටිනාකම එම ගිණුමට හර නොකර ´ලැබිය යුතු සේවක ණය පොලී ප්‍රතිපූර්ණ ගිණුමට´ හර කර තිබුණි.

(ඒ) කර්මාන්ත ගෙවීම් වාර්තා හා ප්‍රගති වාර්තා අනුව සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රාග්ධන වැය වටිනාකම රු.27,408,051 ක් වුවද ආදායම් වියදම් ගිණුමේ ප්‍රාග්ධන වැය වශයෙන් රු.10,550,519 ක් දක්වා තිබුණෙන් ගිණුම්වල ප්‍රාග්ධන වැය රු.16,857,532 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයට අදාල වැටුප් ප්‍රතිපූර්ණ ආදායම රු.45,167,895 ක් වුවද එය රු. 45,640,619 ක් වශයෙන් ගිණුම්ගත කර තිබූ හෙයින් රු.472,724 ක් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 <u>අසම්භාව්‍ය බැරකම්</u>

පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට ගෙවිය යුතු ශේෂය රු.4,658,734 ක්ව තිබුණි. තවද සභාව විසින් මාසිකව ගෙවිය යුතු වාරිකය ලෙස අරමුදල විසින් රු.9,405 බැගින් අය කර තිබුණද එම අය කිරීම සිදු කරණු ලැබීම් සභාවේ කුමන සේවකයන්ට අදාලවද යන්න පිළිබඳව කිසිදු තොරතුරක් සභාව සතුව නොතිබුණි.

1.3.3 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

සමාලෝචිත වර්ෂයට අදාලව අවසාන ශේෂය යටතේ ගිණුම් විෂයයන් 10 කට අදාලව ගිණුම අනුව සහ අදාල ලේඛන අතර රු .3,852,657 ක නොසැසඳීම් පැවතුණි.

1.3.4 <u>ලැබිය යුතු ගිණුම් හා ගෙවිය යුතු ගිණුම්</u>

(අ) 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.27,662,417 ක් වූ අතර ඉන් 19% ක් එනම් රු.5,230,418 ක් වසර 3 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂයන් විය. එමෙන්ම ආදායම් ණයගැති ශේෂය තුල දීර්ඝ කාලයක සිට නිරවුල් නොකරන ලද රු.59,215 ක හිඟ විනෝද බදු ශේෂයක් පැවති අතර පෙර ගෙවුම් ශේෂය තුල නිරවුල් නොකරන ලද රු.9,961 ක තාවකාලික විශ්‍රාම වැටුප් ශේෂයක් හා රු.10,674 ක විශ්‍රාම පාරිතෝෂිත ශේෂයක් ද පැවතුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.11,558,440 ක් වූ අතර ඉන් 32% ක් එනම් රු.3,653,712 ක් වසර 3 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂයන් විය._එමෙන්ම රු.3,604,210 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂය තුල රු.742,390 ක් වටිනා ඉකුත් තැන්පතු ශේෂයන් 60 ක් ඇතුලත්ව තිබුණි.

1.3.5 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

ගිණුම් විෂයයන් 13 කට අදාලව අවස්ථා 09 කදී සමුච්චිත අරමුදලට රු.2,024,389 ක්, ජංගම වගකීම් ගිණුම් 03 කට රු.10,474,454 ක් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීම් ගිණුමට රු.829,713 ගැලපීම් සිදුකර තිබූ නමුත් ඊට අදාල තොරතුරු හෝ ලබාගත් අනුමැතියන් විගණනයට ඉදිරිපත් නොවුණි.

02 <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.8,965,427 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.24,172,360 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.33,137,787 ක පිරිහීමක් පැවතුණි.මෙකී මූල්‍ය ප්‍රතිඵලයට රු.27,616,743 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.10,550,519 ක් වූ ප්‍රාග්ධන වියදම් ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රතිඵලය රු.8,100,797 ක අතිරික්තයක් බවට පත්ව තිබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.78,663,571 න් 78% ක් එනම් රු.60,990,062 ක් සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම්වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.27,616,743 ක මුළු ප්‍රමාණයම ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල්වලින් සමන්විත විය.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.87,628,998 න් 60% ක් එනම් රු.52,762,302 ක් පෞද්ගලික පඩිනඩි සඳහා වියදම වූ අතර ඉන් ආසන්න වශයෙන් 86% ක් එනම් රු.45,640,619 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් විසින් ලබා දී තිබුණි. එම වටිනාකම ආදායම් ආධාර යටතේ ගිණුම්ගත කර තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් බදු හිඟය රු.3,912,758 ක් වූ අතර වාර්ෂික බිල් කිරීම රු.1,696,313 ක් විය. 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 32-42 දක්වා වූ රීතීන් ප්‍රකාරව නිවේදන නිකුත් කිරීමෙන් පසු දේපල තහනමට ගෙන හිඟ වරිපනම් බදු අය කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කර නොතිබුණි.

2.3.2 බදු කුලී

බදු කුලී යටතේ සමාලෝචිත වර්ෂය අවසන් වන විට 2012 වර්ෂයට පෙර සිට පැවත එන රු.3,631,977 ක හිඟයක් පැවති අතර එය වාර්ෂික බිල් කිරීම් වලින් 48% ක් විය.

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ හා වාහන සමීක්ෂණයක් සිදු කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශන අනුව එකී වත්කම්වල වටිනාකම රු.73,380,749 ක් විය.

(ආ) සභාබල ප්‍රදේශයේ කට්ටි කරන ලද ඉඩම්වලට අදාලව කට්ටි සැලසුම් අනුමත කිරීම් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. ඒ හේතුවෙන් ඉඩම් කට්ටි කිරීම හා ඒවාට අදාලව සියයට 1 ක බදු මුදල නිවැරදිව අයකර ඇත්ද යන්න පිළිබඳව හා පොදු කටයුතු සඳහා සභාවට පැවරී ඇති ඉඩම් කොටස් පිළිබඳ තොරතුරු ලබාගත නොහැකි විය.

(ඇ) සභාව පරිහරණය කරන වාහන 05 ක් සඳහා 2014 වර්ෂය හා ඊට පෙර වර්ෂ 06 ක පමණ සිට ආදායම් බලපත්‍ර ලබා නොගෙන ධාවනය සඳහා යොදවා ගෙන තිබුණි.

3.2 අයවැය පාලනය

මුළු පුනරාවර්තන වියදම ලෙස රු.70,649,364 ක් ඇස්තමේන්තු කර තිබුණද තත්‍ය වියදම රු.87,628,998 ක් වූයෙන් ඇස්තමේන්තු වියදම ඉක්මවා රු.16,979,634 ක් වැයකර තිබුණි.

04 <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය